# වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය
# ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය

## ප්‍රසම්පාදන දැන්වීම

**ඩාර්ටන්ෆීල්ඩ් හා කුරුවිට වතුයායේ ඔට්ටපාළු විකිණීම සදහා මිළ ගණන් කැදවීම.**

ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයට අයත් ඩාර්ටන්ෆීල්ඩ් හා කුරුවිට උප මධ්‍යස්ථානයේ පහත සඳහන් ඔට්ටපාළු ප්‍රමාණයන් විකිණීම සඳහා මුද්‍රා තබන ලද මිල ගණන් මෙයින් කැඳවනු ලැබේ.

| ගොණු අංකය | ස්ථානය | ඔට්ටපාළු ප්‍රමාණය (Kg) | ආපසු ගෙවනු ලබන ලංසු සුරක්ෂණ මුදල (රු.) | ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර මුදල (රු.) |
|---|---|---|---|---|
| RRISL/PRO/EST/2025/04 | ඩාර්ටන්ෆීල්ඩ් | 5000 | 14,000.00 | 500.00 |
| | කුරුවිට | 2000 | 5,000.00 | |

මිල ගණන් ඉදිරිපත් කිරීමට පෙර, සතියේ වැඩ කරන දිනයන් හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 කාලය තුළ අදාල ස්ථාන වලදී ඔට්ටපාළු තොගයන් පරීක්ෂා කළ හැකිය.
අදාල මිල ගණන් පත් ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ අගලවත්ත කාර්යාලයේදී සතියේ දින වල දී ලබා ගත හැක. මේ සඳහා රු. 500.00ක ආපසු නොගෙවනු ලබන සහ රු. 19,000.00 ක ආපසු ගෙවනු ලබන මුදල් තැන්පතුවක් ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය නමින් ගෙවීමෙන් පසු මිල ගණන් පත් ඉදිරිපත් කළ හැක. මිල ගණන් ඉදිරිපත් කිරීමේදී කාණ්ඩ දෙකට වෙන වෙනම මිළ ගණන් ඉදිරිපත් කල යුතුවේ.

ඔබගේ මිළ ගණන් පත් සභාපති, ප්‍රසම්පාදන කමිටු (සුළු) වෙත 2025.03.10 දින පෙ.ව. 10.30 ට පෙර ලැබීම පිණිස පහත ලිපිනයට ලේඛණගත තැපෑලෙන් එවීමට හෝ රබර් පර්යේෂණායතනයේ ගිණුම් අංශයේ තබා ඇති පෙට්ටියට බහාලීමට හෝ හැකි අතර, ලිපි කවරයෙහි වම් කෙළවරෙහි " **ඔට්ටපාළු විකිණීම සඳහා මිළ ගණන්** " යන්න පැහැදිලිව සඳහන් කල යුතුය.
මිළ ගණන්පත් විවෘත කිරීම එදිනම මිළ ගණන් බාර ගැනීම අවසන් වූ විගස පහත සඳහන් ලිපිනයේ ගිණුම් අංශයේ දී සිදු කරනු ලැබේ. ඉල්ලුම්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට එදිනට සහභාගී විය හැක. ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් හා නිශ්චයාත්මක වන්නේය.

සභාපති, ප්‍රසම්පාදන කමිටු (සුළු)
ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය
ඩාර්ටන්ෆීල්ඩ්
අගලවත්ත.
2025.02.17

දු.ක - 034-2247426
034-2247383